# බන්ධක වර්ත ජාතකය

තවද කරුණානාථ වූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි සර්පදෂ්ට භික්ෂූන් වහන්සේ අරභයා මේ ජාතකය දක්වන ලද, එක් භික්ෂූ කෙණෙකුන් වහන්සේ විහාර සමීපයෙහි දරපලමින් සිටිකල එක් වෘක්ෂයෙක වසන්නා වූ සර්පයෙක් අවුත් ඒ භික්ෂූන් වහන්සේ දෂ්ට කෙළේය. එකල ඒ භික්ෂූන් වහන්සේ විෂමූර්ජාවෙන් මළසෙක. ඒකථාව භික්ෂූන්වහන්සේ දම්සභා මණ්ඩපයෙහි කිය කියා උන්තැනට සර්වඥයන් වහන්සේ වැඩවදාරා මහණෙනි මා එන්නට පූර්වභාගයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා එපවත් අසා අහිරාජ කුලයට මෛත්‍රී කොට කිසිම අන්තරාවකට නොපැමිණියේය වේදැයි වදාරා ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

ඒ කෙසේද යත්

යටගිය දවස බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යයකරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණව ඉපිද පංචකාමය හැර හිමාලය වනයෙහි ඍෂිප්‍රවෘජ්‍යයාවෙන් පැවිදිව බොහෝ තාපසවරුන්ට ගණශාස්තෘව වාසය රකිණසේක. එසමයෙහි බොහෝ සර්පයන්ගෙන් තාපසවරුන් වහන්ස්ට භය පැමිණෙයි එපවත් බොහෝ තාපසවරුන් වහන්සේට කීසේක. උන්වහන්සේලා එපවත් අසා සතරකුලෙහි සර්පයන්ට මෛත්‍රීකරවයි කියන බෝධිසත්වයෝ මේ ජාතකයේ පළමුවෙනි ගාථාව කියනසේක්.

විරූපක්කේහි මෙ මෙත්තං මෙත්තං එරාපථෙහිමෙ

ඡබ්‍යාපුතෙතහි මේ මෙත්තං මෙත්තං කණ්හා ගොතම කෙහිච

යන මේ ගාථාව කිහ. මෙහි අර්ථ මේ මෙත්තං මාගේ මෛත්‍රිය විරූපක්කේහි, විරූපාක්‍ෂකනම් නාගකුලයන්හාය මේ මේත්තං මාගේ මෛත්‍රිය ඡබ්‍යාපුත්තේහි, ඡබ්‍ය පුත්ත නම් නාගකුලයන්හාය මේ මෙත්තං මාගේ මෛත්‍රී කණ්හා ගෝතම කෙහිච, කණහ ගොතමකනම් අහිරාජකුලයන්හායි මෙසේ සතර කුලයන්ය ඉදින් තෙපි මෙවුන්කෙරෙහි මෛත්‍රීකළාහුනම් සර්ව සාපීපද්‍රව නොවන්නේයයි වදාරා දූන් සාමාන්‍යයෙන් මෛත්‍රීභාවනා දක්වන්නාහු

අපාදකෙහි මෙමෙතනං මෙත්තං දීපදකෙහිච

චතුප්පදෙහි මෙමෙත්තා මෙත්තං බහුප්පදෙහිමෙ

යන මේ ගාථාව කීහ. මෙමෙත්තං මාගේ මෛත්‍රිය අපාදකෙහි අප දූක දීර්ඝජාතීන් කෙරෙහිය මෙමෙත්තං මාගේ මෛත්‍රිය දීපදකවූ මනුෂ්‍යයන් හා පක්ෂීන් හාය. මෙමෙතතං මාගේ මෛත්‍රිය බහුප්පදෙහි, චතුෂ්පාදවූ හස්ත්‍යශාචාදීන්හාය. මෙමෙත්තං මාගේ මෛත්‍රිය බහුප්පාදෙහි ගොනුසු ආදීවූ බොහෝ පා ඇත්තවුන් කෙරෙහිය. මෙසේ මෛත්‍රීභාවනාවෙහි ස්වරූප දක්වා දූන් යාඥාවශයෙන් ආරක්ෂා දක්වන්නාහූ

මාමං අපාදකො හිංසි මාමං හිංසි දිපාදකො

මාමං චතුප්පදෝ හිංසි මාමංහිංසි බහුප්පාදො

යන මේ ගාථාව කීහ. අපාදකො අපාදසතෙක් මාමංහිංසි මානගමක් පොළඹ දීපංදකො දිපාද සත්වයෙක් මාමංහිංසි මානගමක් පෙළඹා චතුප්පාදො සිව්පාසතෙන් මංමංහිංස මානගමක් පොළවා බහුප්පදෝ බොහෝ පා ඇති සතෙක් වාවංහිංසි, මානගමක් පෙළවා දූන් අනෙදිස්සකාහෙයින් මෛත්‍රිය දක්වන්නාහු

සබ්බේසත්තා සබේපාණා සබේබභූතාච කෙවලා

සබේබභද්‍රානි පස්සන්තු මාකංචිපාප්මගමා

යන මේ ගාථාව කිහු සබේබසත්තා ඇමසත්හුද සබේබෙපාන හැමප්‍රාණිහුද, සබේබභූතාච කෙවලා හැමභූතකයෝද සබේබ හැමදෙනාම භද්‍රානි කල්‍යාණයන් පස්සන්තු දකිත්වා කිඤ්චිං මොවුන් කෙරහි කිසිසතක්හුකරා පාප දුකක් මා ආගම් නගමක් නොපැමිණෙව මෙසේ හැමසතුන් කෙරෙහි අනෝදිස්සකහෙයින් මෛත්‍රී දක්වා දූන් තුනුරුවන් ණ සිහිකරණ පිණිස අප්පමානො බුද්ධෝ අප්පමනො ධම්මෝ අප්පමානො සංඝයා යනු කීහ. බුද්ධා බුද්ධරත්නයද අප්පමත්තෝ අප්‍රමානය කරන්නාවූ කේලේශයන් නැතිහෙයින් ගුණයන්ගේ ප්‍රමාණ නැතිහෙයින්ද අප්‍රමාණයි. ධම්මෝ ධම්මනතයද උක්ත ප්‍රකාරහෙයින් ප්‍රමාණ නොකොටහැකි හෙයින් අප්පමානෝ, අප්‍රමාණයක් නැත්තේය. සංඝෝ සංඝරථනය අප්පමානො අප්‍රමානය ධර්මය සමානයෝගයෙන් අප්පමානයයි මෙසේ රත්නත්‍රයෙහි ගුණ සිහිකරවයි වදාරා ප්‍රමාණ සත්වයන් දක්වන්ට ප්‍රමාණවන්තනි

සිරිංසපානී අහිවිච්චජිකාසතපාදී උන්නාභිසර වූ මුසිකා යනුකී හූ සිරංසපානී දීර්ඝ ජාතීහූ ප්‍රමානවන්තානි ප්‍රමාණ කර කේලශ සංයෝගයෙන්ද අප්‍රමාණකර ගුණයෙන් නැතිහෙයින්ද ප්‍රමාණවත්හුයි දුන් අහිංසා යනාදින්ඩ වුන් ස්වරූපයෙන් දක්වත් අහි සර්පය විච්ජිතා ගොනුසුය. සතපාදී පත්තැයහ. උන්නානාභි මකුළුවහ සරබූ සිකනැලහ මූසිකා සියහ යන මොවුයි දූන් මත්තෙහි කටයුතු දක්වන්නාහූ.

කතා මෙරකබා කතා මෙපරිත්තා පටික්කමනතුභූතානි

සොහං නමො භගවතො නමො සත්තන්නං සම්මාසම්බුද්ධනනති.

යන මේ ගාථාව කියත් රත්නත්‍රයෙහි ගුණානුස්මරණය කරන්නාවූ මේ මා විසින් රක්බා රක්ෂාතොමෝ කතා කරණලද මේ මා විසින් පරිත්තා පරිත්තානයෝ කතා කරණලද භූතානි සත්වයෝ මේ මා කෙරෙහි අහිත, අදහස් ඇති භූතානි, සත්වයෝ පටික්කමන්තු පහවෙත්වා සොහං එ මම භගවතො අතීතවූ භාග්‍යවත් බුදුන්ට නමො නමස්කාරකෙරෙමි. සත්තනතං සම්බුද්ධානං අතීතවූ විප්සසීආදීවූ සත් බුදුන්ට නමො නමස්කාර කෙරෙමි. යනාදීන් ඛන්ධපරිත්තය තපස්වරුන්ට ඉගැන්වූහ. එතැන්පටන් තාපසවරුන්ට සර්පයන්ගෙන් කිඩගයක් නුවුයේයයි වදාරා ඛන්ධවත්තී ජාතකය නිමවා වදාළ සේක. එසමයෙහි තාපසවරු නම් බුදු පිරිසය. ගුණනායකව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාළසේක.